*සැ. යු.–* 2006.12..29 දින පළවූ අංක 1,478 දරණ *ගැසට් පත්‍රයේ* I / II (අ) කොටස හා  IV (අ) කොටස් පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,479 - 2007 ජනවාරි 05 වැනි සිකුරාදා - 2007.01.05**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම  ගොනු කර ගත හැකි පරිදි සෑම  කොටසකටම අයත් එක් එක්  භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 08 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 09 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 10 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී  ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු  ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජනවාරි මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 දෙසැම්බර් මස 29 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්‍ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, නුගේගොඩ, ජම්බුගස්මුල්ල මාවත, වැකන්ද පාර අංක 15 දරන ස්ථානයේ කළුතන්ත්‍රිගේ නිශාන්ත ප්‍රදීප් කුමාර පීරිස් වන මා විසින් නුගේගොඩ, ජම්බුගස්මුල්ල මාවත, වැකන්ද පාර, අංක 15 පදිංචි මහේෂිකා ශිරෝමනී පීරිස් විවාහයට පෙර කාරියවසම් යන අයට 2004 අප්‍රේල් මස 19 වැනි දින දීප්ති එච්. ලියනගේ ලියා සහතික කරන ලද අංක 6921 දරන ඇටර්නි බලපත්‍රය මගින් දී ඇති බලය වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස දින සිට අවලංගු සහ බල රහිත කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයට සහ ජනතාවට දන්වා සිටිමි.

කළුතන්ත්‍රිගේ නිශාන්ත ප්‍රදීප් කුමාර පීරිස්.

2006 දෙසැම්බර් මස 14 දින දී ය.

01-03

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

කොළඹ- 03, කොල්ලුපිටිය පාරේ, අංක 578/10, දරන ස්ථානයෙහි පදිංචි කළුතරගේ සංඝදාස ප්‍රනාන්දු වන මම, කොළඹ- 06, වැල්ලවත්තේ 39 වන පටුමගෙ හි අංක 16 දරන ස්ථානයෙහි පදිංචි සමිත දයාලු මංගල වීරපුර යන අයට දී ඇති ඇස්. ඒ. හේමපාල නොතාරිස් මහතා විසින් 1996 අප්‍රේල් 22 වන දින සහතික කළ අංක 140 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව රජයට සහ සියලු දෙනාට මෙයින් දැනුම් දෙමි.

01-76

# රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය මහලේකම් බල ප්‍රදේශය තුළ 2007 වර්ෂයේ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජාවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි වලටත්, එම කාලය තුලදී වලංගුව පවත්වා ගෙන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසි වලටත් යටත්ව 2007 වර්ෂය තුළ විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් වන මවිසින් 2006.12.28 දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර,

(අ) ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් සහ,

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශය ප්‍රාදේශිය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

(I) ටෙන්ඩර් පත්‍රය මුලුමනින් ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතුය.

(II) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතුයි.

(III) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතුය.

මෙකී අවශ්‍යතාවයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර තබා ගන්නා ලද,
(අ) ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ කුවිතාන්සිය සහ

(ආ) වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබන ලියුම් කවරයෙහි වම් කෙළවරේ මුදුනේ "තැබෑරුමේ අංකය සහ නම" සඳහන් කර මහනුවර සහ කඩවත් සතර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුයි. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම මහනුවර ප්‍රාදේශිය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාර ගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන් හිදී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර්යක් ඉදිරිපත් කළ අය " වරප්‍රසාද මිලදී ගත් තැනැත්තායි " ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී රා තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතුය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවක් විසින් "ගෙවීම සඳහා" යයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත් " නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතුය.

06. විදේශ මැත්පැන් තැබෑරුම් වල හෝ වෙනත් බලපත්‍ර ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග (පීප්ප) අරක්කු නිකුත් නොකරනු ලබන බව සැළකිය යුතුය.

07. මහනුවර ඇසළ පෙරහැර සමයේ ආරක්ෂක හේතූන් මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන කොළඹ වීදිය, විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදු වුවහොත් එම වසා තැබීමේ කාලය තුලදී රේන්ද වාරික සහන සැළසීමක් කරනු නොලැබේ.

08. පූර්වෝක්ත දිනයේදී විකිණීමට නොහැකි වූ තැබෑරුම රේන්ද නැවත විකිණීම 2007.01.18 වැනි දින පෙරවරු 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලව විය යුතුය.

09. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

බී. ජී. එච්. එම්. සුගතදාස,
ප්‍රාදේශිය ලේකම්,
මහනුවර.

2006 දෙසැම්බර් මස 16 වැනි දින,
මහනුවර සහ කඩවත් සතර,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**2007 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කර " විදේශ මත්පැන් " තැබෑරුම් රේන්දය**

| *අනුක්‍රමික අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිට විය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කර තබන කාලය* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| අංක 1 කොළඹ විදිය | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල ඡන්ද කොට්ඨාසය තුළ | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 10 කොටුගොඩැල්ල ඡන්ද කොට්ඨාසයේ තුළ කොළඹ වීදිය සහ කාසල්හිල් වීදිය මංසන්ධියෙන් කොළඹ වීදිය වටුගොඩපිටිය පාරේ මංසන්ධියටත් අතර කොළඹ වීදිය දෙපාර්ශවයේ ම | පෙ. ව. 11.00 ප. ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 ප. ව. 8.00 දක්වා | 2006.12.28 වැනි දින පෙ. ව. 10.30 දක්වා |

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල - 2007 රු. 5,000

අංක 1 කොළඹ විදිය, විදේශ මත්පැන් තැබෑරුම

*සැලකිය යුතුයි.*– ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අංක ඊ. සී/ජීආර්එල්/2007 හා 2006.11.22 දිනැති ලිපියට යටත්ව.

12-16

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2000000025.

ණයකරුගේ සම්පූර්ණ නම : කරුණා පතිරන්නැහැලාගේ හේමචන්ද්‍ර

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.02.25 වන දින අංක 1382 දරන *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.04.30 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මයා විසින් 2007.01.25 වැනි දින ප. ව. 2.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්එක් දහස් දෙසිය අනූ අටයි ශත හතලිස් අටක (රු. 1,51,298.48) මුදලක් වර්ෂ 2002.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූහත්දහස් හයසිය තිස්පහයි ශත දහසයක (රු. 97,635.16) මුදල ද, 2002.03.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්තුන්දහස් හයසිය හැටතුනයි ශත තිස්දෙකක (රු. 53,663.32) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පනස් එක්දහස් දෙසිය අනූඅටයි ශත හතලිස් අටක (රු. 1,51,298.48) ද,

(2) එකී රුපියල් අනූහත්දහස් හයසිය තිස්පහයි ශත දහසයක (රු. 97,635.16) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට,

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, ග්‍රාම සේවා කොට්ඨාස 22 බී හි කෙන්දල් කෝරළයේ මධ්‍යම නුවර පළාතේ පරසන්ගස්වැව ගමේ පිහිටි පරසන්ගස්වැව ඉඩම නැමැති ඉඩමට 1989.06.14 දින මිනුම්පති විසින් මැන සාදන ලද එෆ්. වී. 145 අනුව ලොට් 44 ට මායිම්, උතුරට : ලොට් 50, නැගෙනහිරට : ලොට් 25 (පාර), දකුණට : ලොට් 50, බටහිරට : ලොට් 50 යන මායිම්තුළ පිහිටි හෙක්ටයාර් 0.552 ක් *හෙවත්* අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් හයක (අ.1, රු. 1, පර්. 6) වපසරියකින් යුතු ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ස්වර්ණභූමි 58/191 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 22 වන දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

02-114

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1900000775.

ණයකරුගේ සම්පූර්ණ නම : ජයසිංහ ආරච්චිගේ ලයනල් හරිශ්චන්ද්‍ර

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.09.26 වන දින අංක 1308 දරන *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.12.03 වන දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මයා විසින් 2007.01.24 වැනි දින ප. ව. 2.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැත්තෑ හයදහස් පන්සිය හතරයි ශත විසිදෙක (රු. 1,76,504.22) මුදලක් වර්ෂ 2002.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ විසිඑක්දහස් එකසිය අනූහතයි ශත තිස්හතක (රු. 1,21,197.37) මුදල ද, 2002.12.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්පන්දහස් තුන්සිය හයයි ශත අසූපහක (රු. 55,306.85) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැත්තෑහයදහස් පන්සිය හතරයි ශත විසි දෙකක් (රු. 1,76,504.22) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ විසිඑක්දහස් එකසිය අනූහතයි ශත තිස්හතක (රු. 1,21,197.37) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.50% බැගින් වන පොළියක් 2003.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ලියාපදිංචි කොට්ඨාසයේ, ගොන්නාව අංක 1388 ග්‍රාමසේවා කොට්ඨාසයේ අංගමුව කෝරළේ ගොන්නාව ග්‍රාමයේ පිහිටි අඹන්ගහලන්දම් මුකලාන නමැති ඉඩමට 1984.12.21 දින මිනුම්පති විසින් මැන සාදන ලද එෆ්. වී. පී. 2417 පිඹුරේ අංක 176 මායිම්, උතුරට : එම ඉඩමේ 159 ද, නැගෙනහිරට : එම ඉඩමේ කැබලි 152 (පාර) ද, දකුණට : එම ඉඩමේ කැබලි 177 ද, බස්නාහිරට : එම ඉඩමේ කැබලි 160 සහ 175 ද,යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් බිංදුවයි දශම හයයි දෙකක (අ. 0, රු. 2, පර්. 0.62) වපසරියකින් යුතු වූ ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඩී. ඩී. 66/2344/92 හි ලියාපදිංචි කරන ලදී

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 22 වන දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

01-115

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1803300098.

ණයකරුගේ සම්පූර්ණ නම : රාමා විජේසිරි අමරවීර

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2002.05.31 වන දින අංක 1239 දරන *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2002.06.01 වන දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "වීරකේශරී" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. අයි. ගල්ලැල්ල මයා විසින් 2007.01.24 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හයදහස් දෙසිය දහසයයි ශත අනූහතක (රු. 3,06,216.97) මුදලක් වර්ෂ දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ දහනමදහසක (රු. 1,19,000) මුදල ද, 2001.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ අසූහත්දහස් දෙසිය දාසයයි ශත අනූහතක (රු. 1,87,216.97) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ හයදහස් දෙසිය දාසයයි ශත අනූහතක (රු. 3,06,216.97) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ දහනවදාහක (රු. 1,19,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2001.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස,

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ වල්ගම් පත්තු කෝරළේ වාරියපොල ප්‍රාදේශීය සභා සීමාවේ මහකෙලිය හා කෙළිමුනේ පිහිටි යබරගල්ගොඩ සහ වීරගොල්ලහේන නමැති ඉඩමට වර්ෂ 1990.03.22 දින ඩබ්. සී. එස්. එම්. අබේසේකර මානක තැන විසින් මැන සැකසූ අංක 51/90 පිඹුර ප්‍රකාර ලොට් 89 ට මායිම්, උතුරට : ලොට් අංක 97 මාර්ග අයිතියද, නැගෙනහිරට : ගම් සහා පාර ද, දකුණට : ලොට් අංක 88 ද, බස්නාහිරට : ලොට් අංක 90 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහඅටක (අ. 0, රූ. 0, පර්. 18) වපසරියකින් යුතු වූ ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග අයිතියද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1013/40 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 22 වන දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

01-113

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධන ය කරන ලද

### ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

වාද්දුව, වෙරළ පාර, අංක 16 හි එස්. අයි. පී. ද සිල්වා මහතාගේ ණය වගකීම් සඳහා උකස් දේපල තනි අයිතිකරු - ලක්සිරි ඒජන්සීස්

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.11.17 දිනැති අංක 1472 දරණ *ගැසට් පත්‍රයේ* හා 2006

නොවැම්බර් 10 දිනැති දිනමිණ, තිනකරන් සහ 2006 නොවැම්බර් 13 දිනැති ඩේලිනිවුස් යන පුවත්පත්වල පල කරනලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරණ වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවියයුතු පොලියද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛණයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2007.01.27 වෙනි දින පෙ. ව. 11.00ට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව්, අංක 474 හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්ද ප්‍රාදේශීය සභා සීමාවේ තල්පිටිය උතුරේ පිහිටි කිරිපෙල්ලගහවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ඒ. විජේසූරිය විසින් සාදනලද 1998.03.26 දිනැති අංක 1111 දරණ පිඹුරේ විස්තර කළ ලොට් 1 බී වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : අංක 1111 දරන පිඹුරේ ලොට් 1ඒ (නමුත් ලොට් 1 වශයෙන් ලියාපදිංචි කර ඇති) ද, නැගෙනහිරට අංක 1111 දරණ පිඹුරේ ලොට් 1ඒ සහ 1 සී සහ අංක 1460 දරන පිඹුරේ ලොට් 2 සහ අංක. 350 දරන පිඹුරේ ඒ. එස්. සී. පෙරේරාගේ ලොට් බී ද, දකුණට ප්‍රින්සි පෙරේරාගේ කෝන්ගහවත්ත ද, බස්නාහිරට එම්. එම්. සොයිසාගේ දෙල්ගහවත්තද, මායිම්ව රූඩ් එකයි පර්චස් දහයක (රූඩ්. 1 පර්. 10)ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ්340/62 හි ලියාපදිංචි කර ඇත.

දෙවෙනි උපලේඛනය

එකී තලපිටිය උතුරේ පිහිටි කිරිපැල්ලගහවත්ත නැමැති ඉඩම,එකී අංක 1111 දරණ පිඹුරේ විස්තර කළ ලොට් 1 සී වශයෙන් සඳහන් (අඩි 12 ක් පළල පාර සඳහා වෙන්කළ) බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : එකී අංක 1111 දරණ පිඹුරේ ලොට් 1 ඒ ද, නැගෙනහිරට : දෙබැද්ද පාරද, දකුණට : අංක. 1460 දරණ පිඹුරේ ලොට් 2 ද, බස්නාහිරට: ලොට් 1 බී ද, මයම්ව පර්චස් හයක (අ: 0 රූ.0 පර්: 6 ) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය පානදුර ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලය එප් 340/63 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. ඒ. ජී. කරුණාරත්න,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.
අයකරගැනීම් (ශාඛා)

ලංකා බැංකුව,
අයකරගැනීම් ශාඛා ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.
2006 දෙසැම්බර් මස 11 වැනි දින.
01-120

ලංකා බැංකුව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.07.07 දිනැති අංක 1453 දරණ *ගැසට් පත්‍රයේ* හා 2006.06.26 දිනැති ඩේලිනිවුස් දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරණ වගන්තිය යටතේ අය කර ගත හැකි මුල මුදලේ ශේෂය ද විකිණීම කරන දිනය තෙක් ඒ මත අය විය යුතු පොළිය ද ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2007.02.10 වෙනි දින පෙ. ව. 11.00 ට නො 290 හැව්ලොක් පාර කොළඹ 5 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

උකස් බැඳුම්කරයේ සඳහන් උප ලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුන උතුරේ කළුතර බද්දේ කළුතර නගර සභා සීමාවේ කළුතර වෙලපුර හි පිහිටි ද අල්විස් පෙදෙස වරිපනම් අංක 45/3 දරණ වෙලේගොඩවත්තේ ලොට් 12 නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එන් ද එස් වීරක්කොඩි විසින් සාදන ලද 1996 නොවැම්බර් 23 දිනැති අංක 3738 දරණ පිඹුරේ විස්තර කළ ලොට් 12බී: වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 12ඒ ද නැගෙනහිරට: අංක 1158 දරණ පිඹුරේ ලොට් 6 ද බස්නාහිරට: අංක 1158 දරණ පිඹුරේ ලොට් 5 (දැන් නගර සභා පාරකට වෙන්කර ඇති) සහ පාරේ කොටස සහ ලොට් 18 ද මායිම්ව එකී අංක 3738 දරණ පිඹුර අනුව පර්චස් දාහතරයි දශම අටයි එකක (අ.0 රූ.0 ප.14.81) බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ වැවෙන දේ ද වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 152/76 හි ලියාපදිංචි කර ඇත.

එකී වේලාපුර කළුතර හි පිහිටි වෙලගොඩවත්ත (පාරක් සඳහා වෙන් කළ) නමැති ඉඩම කළුතර දිස්ත්‍රික් අධිකරණයේ නඩු අංක පී/1383 හි ගොනු කර ඇත්තාවූ බලයලත් මිනින්දෝරු එන් ද එස් වීරක්කොඩි විසින් සාදන ලද 1996 නොවැම්බර් 23 දිනැති අංක 1158 දරණ පිඹුරේ විස්තර කළ ලොට් 5 වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල මත පාරේ අයිතිය සමඟ එකී අංක 1158 දරණ පිඹුර අනුව පර්චස් හතයි දශම දෙකයි බිංදුවක (අ.0 රූ.0 පර්.7.20) බිම් ප්‍රමාණයකින් යුක්තවේ මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 2/ 149 හි ලියාපදිංචි කර ඇත.

එකී වේලාපුර කළුතර හි පිහිටි වෙලගොඩවත්ත (පාරක් සඳහා වෙන් කළ) නමැති ඉඩමේ එකී පිඹුරේ විස්තර කළ ලොට් 10 වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල එකී අංක 1158 දරණ පිඹුර අනුව පර්චස් දශම අටයි හතරක (අ. 0 රූ. 0 පර්. 00.84) බිම් ප්‍රමාණයකින් යුක්තවේ මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 2/155 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

එම්. ජී. විජේතුංග,
කළමනාකරු

බේරුවල ශාඛාව.

01-119

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි (සේවක ණයදීමේ දෙපාර්තමේන්තුව)

1990 අංක 04 දරණ බැංකු මගින් ප්‍රදානය කරල ලද ණය අයකර ගැනීමේ

(විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර,

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මැද පත්තුවේ සියනෑ කෝරළේ ඇඹරළුවේ පිහිටි මිල්ලගහවත්ත නැමති ඉඩමේ බලයලත් මානක වී. එෆ්. ජේ. පෙරේරා විසින් 1999 මාර්තු 09 වන දින සාදන ලද අංක 14166 දරණ පිඹුරේ පෙන්වා ඇති ලොට් 4ඒ1 දරණ පර්චස් දහසයයි දශම පහක (අ. 0 රූ.0 පර්.16.5) විශාල ඉඩම වේ.

පිහිම්බියගේ රුවන් පුෂ්පකුමාර ප්‍රනාන්දු ණයකරු හැටියට ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2007 ක්වූ ජනවාරි මස 31 වන දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.10.13 වන දින රජයේ *ගැසට් පත්‍රයද* 2006.10.14 වන දින ලංකාදීප, තිනකරන් සහ ද අයිලන්ඩ් පත්‍ර ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2007.01.05 වන දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2007.01.05 වන දින ලංකාදීප සහ අයිලන්ඩ් පත්‍රද බලන්න.

*ඉඩමට පිවිසීම.*– කිරිල්ලවල හන්දියේ සිට (කන්දකපාපු හන්දිය) වැලිවේරිය පාර ඔස්සේ ආසන්න වශයෙන් කිලෝමීටර් 1.6 ක් අරලිය ගහ හන්දිය දක්වා ඉදිරියට ගොස් දකුණට හැරී ඇඹරළුව පාර ඔස්සේ ආසන්න වශයෙන් කිලෝමීටර් 01 ක් ගොස් වමට හැරී ගල් සහ තාර දමා සකසා ඇති නැඳුන්ගහහේන හන්දිය දක්වා දිවෙන ප්‍රාදේශීය සභා පාර ඔස්සේ ආසන්න වශයෙන් මීටර් 400 ක් ගියවිට මෙම පාරේ ම දකුණු දෙසින් සඳහන් කළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%)
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි. (01%)
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
4. නොතාරිස් ගාස්තුව විකිණීමේ කොන්දේසි සකස් කිරීම සඳහා රු. 2000/-
5. ලිපිකරු සහ ඝෝෂක වේතනය රු. 500/-
6. සියලුම ප්‍රචාරක වියදම්
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත දී, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරු සහ උසාවි කොමසාරිස්, කොළඹ
වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය,
රාජ්‍ය හා වාණිජ බැංකු.
අංක: 99, හල්ස්ඩොර්ප්ස් පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය: 2445393.

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 21, බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 01.

දුරකථන අංක 2347717, 2447167
ෆැක්ස් අංකය 2347717

01-84

---

## මහජන බැංකුව – ඕල්කොට් මාවත ශාඛාව

1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, මැද පත්තුවේ දකුණු ඇඹරළුවේ පිහිටි "මිල්ලගහවත්ත" නැමති ඉඩමේ බෙදා වෙන් කළ "ඒ" අක්ෂරය දරන පදිංචියට සුදුසු පරිසරයක පිහිටි උළු සෙවිලි කළ නිවස සහිත පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20.00)ක් විශාල ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.01.27 වැනි දින පෙ. ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අනුමත දේපළ වෙන්දේසි යෝජනාව 2004.10.04 දින *ගැසට් නිවේදනයේ* 2004.10.15 දින දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– කොළඹ වැලිවේරිය බස් මාර්ගයේ නැඳුන්ගල පන්සල අසලින් වමට ඇති පාරේ කි. මී. 2ක් පමණ ගිය විට වමට ඇති ගුරු පාරේ මීටර් 200ක් පමණ ගිය තැන පාර කෙළවර මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(1) ගැණුම් මිලෙන් 10%ක්,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
(3) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
(4) ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
(5) විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
(6) විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත, කොළඹ ආදිපාද වීදියේ, අංක 11, මහජන බැංකු, බටහිර කලාප 01 කාර්යාලයේ සහකාර සමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 2387068
ෆැක්ස් අංකය : 2435977

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
සාම විනිසුරු, මහාධිකරණ සහ දිසා අධිකරණ
කොමසාරිස්, වෙන්දේසිකරු, තක්සේරුකරු
සහ භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145.
0777-212602

01-106

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – මීනුවන්ගොඩ ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා ලත් බලය මත පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේ දී 2007 ජනවාරි මස 25 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරලේ දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව තුළ කලාහුංගොඩ පිහිටි දිවුල්ගහවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක කේ. කේ. ඒ. එස්. පද්මිණි විසින් මැන සාදන ලද අංක 461 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 දරන ඉඩමට (විශාලත්වය අ. 0 රූ. 0 පර්. 26.06) මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ 2003.03.27 දින සහ අංක 430 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගලිහංග මිල්ලිත් රෝයි පෙරේරා ණයකරු හැටියට පැහැර හැර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.11.03 දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2006.11.03 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු. 500) ද,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (2,000) ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් තොරතුරු විමසන්න. කළමණාකරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 දුරකථන අංක 2661815, 2661816.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

දුරකථන අංකය: 2863121.

01-107/2

---

## මහජන බැංකුව-මීගමුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

දිවුලපිටිය මීගමුව පාරේ දූනගම හන්දියට තුදුරින් ද/ඉදුරුඅගාර ග්‍රාමයේ අංක 88 ඩී දරන ස්ථානයේ පිහිටි වටිනා දෙමහල් නිවස සහිත පර්චස් 30 ක විශාල ඉඩම මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.01.28 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2004.09.10 වැනි දින *රජයේ ගැසට්* පත්‍රයේ ද, 2004.08.24 වැනි දින දිනමිණ පත්‍රයේ ද, 2004.08.24 වැනි දින ඩේලිනිව්ස් පුවත්පතේ ද, 2004.08.24 වැනි දින තිනකරන් පුවත්පතේ පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* ._ දිවුලපිටිය-මීගමුව පාරේ දූනගහ හන්දියට නුදුරින් දකුණට ඇති ඉදුරාගාර පාරේ ද/ඉදුරාගාර ග්‍රාමයේ අංක 88 ඩී දරන ස්ථානයේ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරි බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2-1/2% ක්,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක්වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත නාත්තන්ඩිය පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 032-2253300, 032-2253301
ෆැක්ස් අංකය : 032-2255247.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමානායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
මුළු දිවයිනටම සාම විනිසුරු.

අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථනය : 2419126.

01-122

---

## මහජන බැංකුව-බොරුල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ මාලාබේ පිහිටියා වූද, 'අළුබෝගහවත්ත' යැයි කියනු ලබන ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0 රූඩ් 0 පර්. 13.20 ක් විශාල ඉඩම මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2007 ජනවාරි මස 27 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා.* 2004.09.05 වැනි දින *රජයේ ගැසට්* පත්‍රය ද 2003.08.25 වැනි දින දිනමිණ, ඩේලිනිව්ස් හා තිනකරන් යන පුවත්පතවල පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.–* මාලාබේ සි අතුරුගිරිය පාරේ කි. මී. 1/2ක් 'පමණ ගිය විට පාරේ වම්පස සුසිලාරාම පාර හමුවේ. එම පාරේ කි. මී. 1/4 ක් පමණ ගොස් පාරේ දකුණු පසට ඇති ගුරු පාරේ මීටර් 200ක් පමණ ගියවිට පාරේ වම්පස අංක 520/18 දරන අදාල දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළත් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2% ක්,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක්වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ- 01, ආදිපාද වීදියේ පිහිටි මහජන බැංකු කලාප කාර්යාලයේ (බටහිර කලාපය 01) සහකාර සාමාකනාධිකාරී මහතාට ගෙවිය යුතුය

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංකය : 2327848, 2393678, 4-717008.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමානායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
මුළු දිවයිනටම සාම විනිසුරු.

අංක 11/55, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංකය : 2419126, ෆැක්ස් අංකය : 719526.

01-121

---

## මහජන බැංකුව-ගම්පහ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

යක්කල, ගම්පහ පාර, අංක 22/24 හි පිහිටි පර්වස් විස්සයි දශම පහයි බින්දුවක (අ. 0 රූ. 0 පර්. 20.50)ක පදිංචියට සුදුසු නිවසක් සහිත වටිනා ඉඩමක් මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2007.01.25 වැන දින පෙ. ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දී දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 1999.06.04 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 1999.05.06 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– යක්කල සිට ගම්පහ දෙසට මීටර් 500ක් පමණ දුරින් ප්‍රධාන පාරට යාබදව වම්පසින් වරිපනම් අංක 22/24 හි මෙම සුරැකුම් දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරි බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2-1/2%ක්,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 033-2222325, 033-2226741, ෆැක්ස් : 033-2226165.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ටී. එස්. රාමානායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ බ්‍රෝකර්කරු,
මුළු දිවයිනටම සාම විනිසුරු.

අංක 11/55, කුඩා බුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංකය : 011-2419126.

01-124

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 1998/204/වීආර්.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.05.11 දිනැති අංක 1184, 2002.09.13 දිනැති අංක 1254, 2003.11.28 දිනැති අංක 1317 දරන *ගැසට් පත්‍රයන්හි* හා 2001.05.09, 2002.09.06 දිනැති ඩේලිනිවුස්, තිනකරන් යන පුවත්පත්වල හා 2001.05.09 හා 2002.09.09 දිනැති දිනමිණ පුවත්පතෙහ පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2007 ජනවාරි 20 වැනි දින පෙ. ව. 11.00 ට මහරගම, පමුණුව පාර, දෙල්ගහවත්ත අංක 60/50 හි පදිංචි කුමාරසිංහ වෙන්දේසිකරුවන්හි වෙන්දේසිකාර සී. කුමාරසිංහ මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### පළමුවන උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, නැගෙනහිර අටුලුගම් කෝරළයේ, දැරණියගල හි පිහිටි මාළිගාතැන්න නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ආර්. එච්. ධර්මවර්ධන විසින් සාදන ලද 1997.06.14 දිනැති අංක 97/06/11 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : එල්. වී. ඩිංගිරි මහත්මයා හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : එල්. වී. ඩිංගිරි මහත්මයා හිමිකම් කියන ඉඩම සහ බලයලත් මිනින්දෝරු එච්. සී. වැන්ක්‍රිලන්බර්ග් විසින් සාදන ලද 1980 අගෝස්තු 9, 28,29 දිනැති අංක 1751 දරන පිඹුරේ ලොට් 27 (පාර) ද, දකුණට : අංක 1751 දරන පිඹුරේ ලොට් 26 සහ 27 ද, බස්නාහිරට : එල්. වී. ඩිංගිරි මහත්මයා හිමිකම් කියන ඉඩම සහ අංක 1751 දරන පිඹුරේ ලොට් 26 ද මායිම්ව පර්චස් තිස්නවයයි දශම දෙකක (අ. 0 රූ. 0 පර්. 39.2) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිව් 6/295 හි ලියාපදිංචි කර ඇත.

#### දෙවන උපලේඛනය

එකී දැරණියගලහි පිහිටි මාළිගාතැන්න නමැති ඉඩම එකී අංක 1751 දරන පිඹුරේ විස්තර කළ ලොට් 27 (පාරක් සඳහා වෙන්කර ඇති) වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : මෙම ඉඩමේ ලොට් 23, 24, 25 සහ එච්. ටී. මෙන්ඩිස් විජේසූරිය හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට :මෙම ඉඩමේ ලොට් 20, 21, 22 ද, දකුණට : එච්. ටී. මෙන්ඩිස් හිමිකම් කියන ඉඩම සහ ලොට් 18, 16 සහ 19 සහ බෝපේ කන්ද ඇල ද, බස්නාහිරට : එස්ටේට් පාර ද, එච්. ටී. මෙන්ඩිස් විජේසූරිය හිමිකම් කියන මෙම ඉඩමේ ලොට් 19 සහ ලොට් 26, 24 ද මායිම්ව පර්චස් දහනවයක (අ. 0 රූ. 0 පර්. 19) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිව් 6/247 හි ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. මුණසිංහ,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
දැරණියගල.

01-111

## මහජන බැංකුව-මීගමුව ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මීගමුව ඕතරවාඩිය ගම පිහිටි පොල් වගාව සහිත පදිංචියට සුදුසු අගනා බිම් කොටසක් ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 04, පර්චස් 20 ක් විශාල ඉඩම මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2007.01.21 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිට ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා* : රජයේ *ගැසට් පත්‍රයේ* 2004.07.23 වැනි දින ද, දිනමිණ පුවත්පතේ 2004.12.15 වන දින ද, ඩේලිනිව්ස් පුවත්පතේ 2004.12.15 වැනි දින ද, තිනකරන් පුවත්පතේ 2004.12.15 වැනි දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* : මීගමුව සිට මඩම්පැල්ල හන්දියට ගොස් වමට ඇති බොරලුගල පාරේ සැ. 1 ක් පමණ දුර ගිය පසු වමට ඇති පාරේ යාර 300 ක් පමණ දුරින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* : වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැණුම මිළන් 10% ක්,
2. පළාත් අධිකාරි බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2-1/2% ක්,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක්වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත නාත්තන්ඩිය පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 032-2253300, 032-2253301, ෆැක්ස් : 032-2255247.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
මුළු දිවයිනටම සාම විනිසුරු.

අංක : 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ.

දුරකථන අංකය : 011-2419126.

01-123

B 3 - B 079431

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - ගම්පහ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වන වගන්තිය යටතේ විකිණීම

ඉතා වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල 2007.01.19 වන දින පෙ. ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරලේ රාගම පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභාවේ ගලහිටියාව උප කාර්යාලීය සීමාව තුළ ගලහිටියාවේ පිහිටි තිත්තගහවත්ත නමින් හඳුන්වන ලබන ඉඩමෙන් බෙදා වෙන් කරනු ලැබූ ඉඩමට බලයලත් මානක බ. ප. ගන්ගොඩවල විසින් මැන සාදන ලද 1972 ඔක්තෝබර් 27 දිනැති අංක 2380 දරන පිඹුරෙන් බෙදා වෙන් කරනු ලැබූ ලොට් 7 ලෙස නිරූපිත ඉඩම් කොටස. විශාලත්වය පර්චස් 18.2 යි ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරල ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2003.06.09 වන දිනැති සහ අංක 3763 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පනාවල පතිරණලාගේ දොන් පියරත්න පතිරණ සහ පනාවල පතිරණලාගේ දොන් ප්‍රියන්ත කුමාර පතිරණ ණයකරුවන් හැටියට පැහැර හැර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2005.11.18 දින දරන *රජයේ ගැසට් පත්‍රය* සහ 2006.03.21 වන දින දරන අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*:- විකිණීම ස්ථිර කල වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ.

1. ගැණුම් මුදලින් 10% ක් ද (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිළෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම් සඳහා රු. 2000,
5. ලිපිකරු හා ඝෝෂක වේතනය රු. 500,
6. සියළුම ප්‍රචාරක වියදම් ද,
   ගැණුම් මිළෙන් ඉතිරි 90% (සියයට අනූව) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත ද සී/ස. හැටන් නැෂනල් බැංකුවට ගෙවා නිමකල යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න: කළමනාකරු - ගම්පහ ශාඛාව සී/ස. හැටන් නැෂනල් බැංකුව දුරකථන අංක 032-222250 හෝ ප්‍රධාන කළමනාකරු (ණය අධීක්ෂණ හා අයකිරීමේ දෙපාර්තමේන්තුව) සී/ස. හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී ජයා මාවත, කොළඹ 10. දුරකථන අංකය-2661815, 2661816

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු, (මුලු දිවයිනටම)
උසාවි කොමසාරිස් තක්සේරුකරු,
සහ බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක - 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121
01-107/1

## නැෂනල් ඩිවලොප්මන්ඩ් බැන්ක් ලිමිටඩ්–හලාවත ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ උතුරු පිටිගල් කෝරලේ, හලාවත නගරයේ හලාවත නගර සභා සීමාව තුළ වූ වෝඩ් අංක 2 ඉව්වම්පිටිය සිංහපුර පාරේ පිහිටි තට්වන්කොටුව ලෙස හඳුන්වනු ලබන බලයලත් මානක එම්. එම්. පී. ඩී. පෙරේරා විසින් මැන සාදන ලද 1991 නොවැම්බර් මස 08 වැනි දිනැති අංක 747 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ පර්චස් 16.88 විශාල ඉඩම කොටස තුළ පිහිටි ගහකොළ වගාවන් ගොඩනැගිලි ඇතුළු ස්ථිරවම සවිකර ඇති සහ හෝ තබා ඇති සියළු දේද සමග වේ.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. එම්. ද මැල් විසින් සහතික කරල ලද්දා වූ ද නැෂනල් ඩිවලප්මන්ට් බැන්ක් ලිමිටඩ් (පෙර ජාතික සංවර්ධන බැංකුව) නමට ලියන ලද්දාවූ ද 2002 ක්වූ පෙබරවාරි මස 22 වැනි දින අංක 558 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සඳම්ණි ෆොටෝ ඇන්ඩ් වීඩියෝ කොම්යුනිකේෂන් යන නාමය විලාශය සහ ව්‍යාපාරය යටතේ තනි පුද්ගලයෙකු වශයෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන හලාවත පදිංචි වාසල මුදියන්සේලාගේ පර්සි ඇන්ටන් ප්‍රනාන්දු ණයකරු හැටියට පැහැර ඇති බැවින් නැෂනල් ඩිවලොප්මන්ඩ් බැන්ක් ලිමිටඩ් (පෙර ජාතික සංවර්ධන බැංකුව) විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් කල දේපළ 2007 ජනවාරි මස 19 වැනි දින පෙරවරු 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2005 දෙසැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයද*, 2005 දෙසැම්බර් මස 03 වන දින දිවයින, ද අයිලන්ඩ් සහ 2005 දෙසැම්බර් මස 02 දින තිනකරන් යන පුවත් පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය. (1) ගැණුම් මිලෙන් 10% ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) රු. 55,000/- නොවැඩි වෙන්දේසි වියදම්වලින් 50% ක් ද, (5) ලිපිකරු හා සෝෂක ගාස්තු වශයෙන් රු. 500/- ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2000/- ක් ද වේ. ගැණුම් මිලේ ඉතිරි මුදල වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත සීමාසහිත ජාතික සංවර්ධන බැංකුවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩිදුර විස්තර සඳහා විමසන්න කොළඹ 02, නවම් මාවතේ, අංක 40, පිහිටි නැෂනල් ඩිවලොප්මන්ඩ් බැන්ක් ලිමිටඩ්හි උප සභාපතිනි නීති ගෙන් විමසන්න. දුරකථන අංක 2437701 - 10, හෝ 2448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු,

අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ,
දුරකථන අංක: 2873656, ෆැක්ස් :2871184 ජංගම: 0777-672082.

01-109

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික)

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ | | තැපැල් ගාස්තුව (මෙරට) | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| ජනවාරි | 2007.01.05 | සිකුරාදා | 2006.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.01.12 | සිකුරාදා | 2006.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.01.19 | සිකුරාදා | 2007.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.01.26 | සිකුරාදා | 2007.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2007.02.02 | සිකුරාදා | 2007.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.09 | සිකුරාදා | 2007.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.15 | බ්‍රහස්පතින්දා | 2007.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.23 | සිකුරාදා | 2007.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2007.03.02 | සිකුරාදා | 2006.02.15 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.03.09 | සිකුරාදා | 2006.02.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.16 | සිකුරාදා | 2007.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.23 | සිකුරාදා | 2007.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.30 | සිකුරාදා | 2007.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.